# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2019
2023 දෙසැම්බර්

**සමාජීය විද්‍යා පීඨය**

## ජනසන්නිවේදනය (නව/පැරණි නිර්දේශය)

## නිර්මාණාත්මක සන්නිවේදනය හා විචාර අධ්‍යයනය MACO–E 3025

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. නිර්මාණ කාර්යයට අදාළ මූලිකාංග කෙටියෙන් විස්තර කර නිර්මාණකරුවෙකු සතු ලක්ෂණ නිර්මාණකරණයේදී වැදගත්වන ආකාරය පහදන්න. (ලකුණු - 20)

02. ජන විඥානය පිළිබිඹු කිරීමෙහිලා ජනශ්‍රැතිය නිර්මාණශීලීව භාවිත කර ඇති ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු - 20)

03. ප්‍රවෘත්ති පිළිබඳ පාඨක අවධානය දිනාගැනීමේදී නිර්මාණාත්මක සිරස්තලයට ඇති හැකියාව ශ්‍රී ලාංකේය පුවත්පත් තුළ භාවිත සිරස්තලවලට විශේෂිතව සාකච්ඡා කරන්න. (ලකුණු - 20)

    *හෝ*

    ගුවන්විදුලි මාධ්‍ය තුළ විවිධ වැඩසටහන් නිර්මාණශීලී කර ගැනීමේදී සැළකිලිමත් වියයුතු භාෂාත්මක ලක්ෂණ මොනවාදැයි උදාහරණ අසුරින් විස්තර කරන්න. (ලකුණු - 20)

04. සමාජ හා මානවීය හැඟීම් නිරූපණයේදී සිනමාව තුළ භාවිත සංඥාර්ථ පිළිබඳ උදාහරණ සහිතව විවරණය කරන්න. (ලකුණු - 20)

05. අන්තර් සංස්කෘතික අධ්‍යයනයේ වැදගත්කම හඳුන්වා, අන්තර් සංස්කෘතික සන්නිවේදන බාධක අවම කර ගැනීම නිර්මාණ කාර්යයේදී වැදගත්වන ආකාරය උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු - 20)

06. "සාහිත්‍යකරණයේ අරමුණු මුදුන්පත් කරගැනීමෙහිලා සාහිත්‍යකරුවෝ නිර්මාණාත්මක සන්නිවේදන ලක්ෂණ උපයෝගී කර ගත්හ." ලාංකේය සම්භාව්‍ය සිංහල සාහිත්‍ය නිර්මාණ උදාහරණයට ගෙන සාකච්ඡා කරන්න. (ලකුණු - 20)

07. නිර්මාණ රසවින්දනයේදී විචාරයේ ඇති වැදගත්කම කෙටියෙන් විස්තර කර තෝරාගත් ක්ෂේත්‍රයකට අදාළ නිර්මාණයක් ඔබ කැමති විචාර ප්‍රවේශයක් භාවිත කරමින් විචාරය කරන්න. (ලකුණු - 20)

08. මාතෘකා **දෙකක් (02)** පිළිබඳ සටහන් ලියන්න

    i. මාධ්‍ය පර්යේෂණ හා නිර්මාණාත්මක සන්දේශ
    ii. CGI තාක්ෂණයෙහි (පරිඝනකයෙන් නිර්මිත රූප) නිර්මාණාත්මක ලක්ෂණ
    iii. වෙළෙඳ දැන්වීම්හි නිර්මාණශීලීත්වය
    iv. සමාජ මාධ්‍ය අන්තර්ගතය හා නිර්මාණශීලීත්වය (ලකුණු - 10 X 2 = 20)

************************